**ශීර්ෂය 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂ 151 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 4,439.49 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 4,334.18 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 105.31 ක් හෙවත් සියයට 2.37 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 1,417.66 | 1,391.42 | 26.24 | 1.85 |
| මූලධන | 3,021.83 | 2,942.76 | 79.07 | 2.62 |
| එකතුව | 4,439.49 | 4,334.18 | 105.31 | 2.37 |

**2.2 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සිමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 15101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 8.00 | 7.99 | 3.80 | 5.11 | 30.00 | 21.34 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0089/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 34.57 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 145.62 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0002/0071/000 | 0.02 |
| 6000/0000/00/0013/0040/000 | 14.73 |
| 6000/0000/00/0001/0050/000 | 5.05 |
| 6000/0000/00/0016/0021/000 | 125.81 |
| 6000/0000/00/0018/0045/000 | 0.01 |
| **එකතුව** | **145.62** |

**2.5 විගණන නිරීක්ෂණය**

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |
| (ඈ) | විදුලි උපකරණ පිළබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (ඉ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඊ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (උ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (ඌ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 07 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 09 කට 2017 මාර්තු 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. මිලියන 2,448.04 ක් වී තිබුණි.

### 3.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය විසින් 2017 අප්‍රේල් 30 දින වන විට පියවා නොතිබුණු අග්‍රිම ගිණුමේ ශේෂය රු. 9,687,429 ක් වී තිබුණි. මෙම ශේෂය 2015 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයකි.

### 3.4 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව හිමිකම් පෑමේ කාලය ඉක්ම වූ සියලුම තැන්පත් පිළිබඳ සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේ දී ලැයිස්තුවක් පිළියෙල කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 හා 2015 මාර්තු 25 දින තෙවන පාර්ශවයන් වෙත ගෙවීම් කිරීම සඳහා වූ රු.10,516,070 ක් අදාළ පාර්ශවයන්ට ගෙවීම් නොකර තාවකාලිකව රඳවා ගන්නා ලද තැන්පත් ගිණුමක තැන්පත් කර තිබුණි.

**3.5 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විෂය අංක 15101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට හිඟහිටි ණය ශේෂය රු.948,577 වූ අතර එම ණය ශේෂ වර්ෂ 05 සිට වර්ෂ 31 දක්වා වූ කාලයක සිට පැවත එමින් තිබුණ ද ඒවා අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් නිලධාරින් වෙත ණය ලබාදීමේදී පිළිපැදිය යුතු ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 10.3 වගන්තියට සංශෝධිත ලෙස නිකුත් කළ 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව රු.302,850 ක ණය ලබාදී තිබුණි.

**3.6 අභ්‍යන්තර විගණනය**

---

**වාර්ෂික කාර්සාධන වාර්තාව**

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 නොවැම්බර් 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

වටිනාකම හඳුනාගෙන නොතිබුණු මෝටර් වාහන 10 ක් වර්ෂ 3 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවත එමින් තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

---

2016 දෙසැම්බර් 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 මැයි 09 දින වන විටත් අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2017 සැප්තැම්බර් 08 දින දක්වා එක් එක් අංශවල

සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කර ඇතත් අතිරික්ත, ඌනතා හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

**3.8 බේරුම් නොකළ බැරකම්**

**------------------------------**

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.මිලියන. 33.24 ක් විය.

**3.9 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**--------------------------------------------------------**

2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදය සහ 02 ඡේදය ප්‍රකාරව, අනුයුක්ත කළ නිල වාහන හිමි නිලධාරීන්ට නියමිත ඉන්ධන සීමාව ඉක්මවා රු.299,941 ක් අතිරේක ඉන්ධන ලබා දී තිබුණි.

**3.10 විදේශාධාර ව්‍යාපෘති**

**-----------------------**

සුනාමි ව්‍යසනය බලපෑ දිස්ත්‍රික්ක 07 ක සංවර්ධන කටයුතු ඉටුකිරීමට අපේක්ෂා කරනු ලැබූ විදේශ ආධාර ව්‍යාපෘතියක් ප්‍රධාන සංරචක 10 ක් යටතේ ක්‍රියාත්මක කරන ලද අතර, ඉන් සංරචක තුනක් මඟින් ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධනය හා මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි.

මෙම ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන හා මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉහත වැඩසටහනට අදාල ණය ගිවිසුමේ උපලේඛන 03/10 (09) වගන්තිය අනුව සේවා සපයන ආයතනයක් තෝරා ගැනීමේ දී රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු නොකර 2013 මාර්තු 26 දින පුද්ගලික ආයතනයක් සේවා සපයන ආයතනය ලෙස තෝරාගෙන තිබුණි. ඊට අදාල තාක්ෂණික ඇගයීම 2013 මාර්තු 27 දින සිදුකර ප්‍රසම්පාදනය ප්‍රමාණවත් ඇගයීමට ලක්නොකර 2013 මාර්තු 28 දින ගිවිසුම් අත්සන් කර රු.4,661,000 කට කාර්යය පවරා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) අදාල සේවා සපයන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන ව්‍යාපෘතියේ ක්ෂුද්‍ර ව්‍යාපාර ග්‍රාමීය සංවර්ධන කළමනාකරු ඉහත තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කර තිබුණු අතර ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ පරිපාලන අධ්‍යක්ෂ (ව්‍යාපෘති) ලෙස කටයුතු කරන කළත්‍රයා ද සේවා සපයන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර තිබුණි. එසේම ක්ෂුද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල සේවා වෙනුවෙන් රු.4,661,000 ක් ද ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘති සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක 05 ක උපදේශාත්මක කටයුතු සිදුකර ව්‍යාපෘති සැකසීම වෙනුවෙන් රු.64,323,300 ක් ද සම්බන්ධයෙන් ගෙවීම් වවුචර් අනුමත කිරීම ක්ෂුද්‍ර ව්‍යාපාර ග්‍රාමීය සංවර්ධන කළමනාකරු විසින්ම සිදුකර තිබුණි. මෙම නිලධාරීන් අදාල සමාගමට ඇති සම්බන්ධතාවයන් හෙළිදරව් කර නොතිබීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 191, 192 හා 193 වගන්තිවලට පටහැනිව ක්‍රියාකිරීමක් විය.

(ඇ) උපදේශන ආයතනයේ නිර්දේශ මත සුනාමි ව්‍යසනය බලපෑ දිස්ත්‍රික්ක 7 ක ක්ෂුද්‍ර ව්‍යාපාරිකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර දිස්ත්‍රික් සමුපකාර සමිති සාමාජිකයින් (2250) ගේ ආයෝජනය මත පොදු සමාගමක් පිහිටුවීමට සැලසුම් කර තිබුණි. නිෂ්පාදන අලෙවි කිරීමට ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලැබූ අලෙවිසැල් 7 උපයෝජනය කිරීමට සලස්වා එමඟින් සියලු සාමාජිකයන්ට ප්‍රතිලාභ හිමිවන පරිදි

පොදු සමාගම පිහිටුවා තිබුණි. එහෙත් කොටස්කරුවන් 7 දෙනෙකුට පමණක් සමාගමේ ප්‍රතිලාභ හිමිවන පරිදි කොටස් 35 කින් සමන්විතව පොදු සමාගම ස්ථාපනය කර තිබුණි.

මෙම සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන වැඩ සටහනේ සාර්ථකත්වය සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කිරීම සඳහා පුද්ගලයෙකුට රු.1,080,000 ක් ගෙවා තිබුණ ද එම වාර්තාවේ සඳහන් කරුණු අනුව එය පිළිගත හැකි වාර්තාවක් නොවීය.

(ii) පොදු සමාගමේ කොටස් මිල දී ගැනීම සඳහා සාමාජිකයින් 1276 දෙනෙකුගෙන් රු.1000 බැගින් රු.1,276,000 ක් අයකර තිබුණි. මෙම මුදල් රැස් කිරීම හැර වෙනත් කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සමාගම විසින් සිදුකර නොතිබූ අතර මුදල් ගෙවූ පුද්ගලයින්ට සමාගමේ හිමිකාරිත්වයද ලබා දී නොතිබුණි.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට සමාගමේ බැංකු ගිණුමේ ශේෂය රු.1,257,000 ක් විය. ඒ අනුව රැස්කළ මුදල්වලින් රු.19,000 ක් බැංකු ගත කර නොතිබුණි.

(iv) සීමාසහිත ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සමුපකාර සමිතිය විසින් සාමාජිකයින් තිදෙනෙකුට අලෙවිසැල් සඳහා කඩ කාමර 3 ක් ලබා දී තිබුණ ද එම පැවරීම සම්බන්ධ ලිපිගොනු කිසිවක් සමුපකාර සමිතියට භාර දී නොතිබුණි. කඩ කාමර ලබාගත් පුද්ගලයින් ඒවා වෙනත් පාර්ශව වෙත කුලියට දී ආදායම් ලබා ගනිමින් සිටින අතර අයිතිය තහවුරු කිරීම සඳහා සමුපකාර සමිතිය සතුව කිසිදු ලියවිල්ලක් නොතිබුණි. ඒ අනුව ඉහත ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(v) ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි සමුපකාර සමිතියට අයත් අලෙවි සැල් 3 ක් සාමාජිකයන් තිදෙනෙකුට පමණක් පුද්ගලික වන සේ ලබා දී තිබුණි. සියලු සාමාජිකයින්ගේ නිෂ්පාදන මෙම වෙළඳසැල් තුළ අලෙවි කිරීම ව්‍යාපෘතියේ අරමුණ වුවද එකී අරමුණ ඉටු වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(vi) මාතර දිස්ත්‍රික්කයේ සමුපකාර සමිතියට අයත් අලෙවිසැල්වල බාහිර පුද්ගලයන්ගේ බලපෑම් මත ව්‍යාපාරික කටයුතු සිදු කළ නොහැකි බව වාර්තා වී තිබුණ ද අමාත්‍යාංශය ඒ පිළිබඳ කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් ඉදිරියට පවත්වාගෙන යාමටත් ඒවා පසු විපරම් කර අවශ්‍ය පහසුකම් සැලසීමටත් අමාත්‍යාංශ්‍ය වෙත වගකීම් පැවරී තිබුණු හෙයින් ව්‍යාපෘතිය සතුව තිබූ වත්කම්, ලිපිගොනු සහ ලිපි ලේඛන අමාත්‍යාංශය වෙත පවරා තිබුණි. එළඹ තිබූ ණය ගිවිසුම් අනුව ව්‍යාපෘතිය අවසන් වී වසර 10 ක් අදාල ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගත යුතු වුවත් ලිපි ලේඛන ආරක්ෂා කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබූ අතර විගණනය සඳහා ඉල්ලා සිටි කිසිදු ලේඛනයක් ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය අවසානයේ දී මෙම ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුද්ගලික සමාගම ඉදිරියට පවත්වාගෙන යාම අමාත්‍යාංශය වෙත පැවරී තිබූ අතර ව්‍යාපෘතිය සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන වැඩ සටහනේ දිස්ත්‍රික් ධීවර සමුපකාර සමිති හතෙහි ලිපිගොනු ද අස්ථානගත වී තිබුණි.

(ඊ) ඒ අනුව, ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූ ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් ඇති කිරීම ව්‍යාර්ථ වී ඇති බවත්, පුද්ගලික සමාගම ක්‍රියාත්මක නොවන බවත්, කොටස් ආයෝජනය කිරීමට සමස්ත සමිති සාමාජිකයින්ට මේ යටතේ සහනයක් ලැබී නොමැති බවත්, අමාත්‍යාංශය මට්ටමින් මෙම ව්‍යාපාර සම්බන්ධීකරණයක් සිදු නොකරන බවත් තහවුරු විය.

(උ) ක්ෂුද්‍ර ව්‍යාපාර සංවර්ධන කාර්යය සඳහා පශ්චාත් සුනාමි පුනරුත්ථාපනය හා සම්පත් කළමනාකරණ වැඩසටහන මඟින් දරා ඇති සමස්ත පිරිවැය රු.374,817,606 ක් විය. IFAD සංවිධානයෙන් ණය ගිවිසුම් 2 ක් මඟින් ලබා ගන්නා ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 31.09 ක් වූ ණය ආධාර 2015 ඔක්තෝබර් 15 දින සිට 2045 අප්‍රේල් 15 වන දින දක්වා අර්ධ වාර්ෂිකව සියයට 0.75 ක පොලියක් සමඟ මහා භාණ්ඩාගාරය විසින් වාර්ෂිකව ගෙවීමට සිදු වී තිබුණි. එහෙයින් අපේක්ෂිත කාර්යය අසාර්ථක වී තිබීම මත මෙම ණය ආධාර නිශ්කාර්ය වියදම් වශයෙන් භාවිතා කිරීමක් ලෙස නිරීක්ෂණය කෙරේ.

**3.11 කාර්යසාධනය**

----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

----------------------------------------------

(අ) වෙරළ පුනරුත්ථාපනය හා සම්පත් කළමනාකරණ වැඩ සටහන (ගොඩනැගිලි හා ඉදිකිරීම්)

(i) කලපු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී වෙන් කරන ලද රු.මිලියන 50 ක ප්‍රතිපාදනවලින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට ලබාදුන් රු.16,100,000 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණි. ඒ යටතේ රු. 15,970,110 ක වියදමින් පුත්තලම දිස්ත්‍රික්කයේ පම්බල මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකළ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.15,001,050 ක් විය. ඒ අනුව රු.969,060 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවස්ථා තුනකදී රු.7,371,395 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4.(ii) මාර්ගෝපදේශය ප්‍රකාරව ගෙවීම් වලින් සියයට 90 ක් ගෙවීමට පෙර අත්තිකාරම් සියල්ල පියවා ගත යුතු වුවත් එසේ කටයුතු නොකර මුළු මුදලම වැය විෂයට හර කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව වැඩ අවසන් කිරීමේ සහතිකයක් ව්‍යාපෘති ඉංජිනේරුවරයා විසින් ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 ජූලි 31 දින වන විටත් කාර්යසාධනය සම්බන්ධව වූ එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

(iv) වෙරළ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩ සටහන යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන වලින් නියමිත කාර්යයට අදාල නොවන වෙනත් කාර්යයන් සඳහා රු.2,959,789 ක් වැය කර තිබුණි.

(v) ඉහත ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත රු.1,695,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව දරා ඇති වියදම රු.5,002,395 ක් විය. ඒ අනුව රු.3,907,395 ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

(vi) ඉහත ව්‍යාපෘතිය මාතර දිස්ත්‍රික් ලේකම් වෙත රු. 375,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර රු. 255,000 ක් වියදම් දරා තිබුණි. ඒ යටතේ ඉටුකළ කාර්යයන් වාර්තා කර නොතිබුණු අතර පසුවිපරම් කටයුතු ද සිදුකර නොතිබුණි.

(ආ) මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් මිරිදිය ජලාශවල නොමිලේ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම.

(i) මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 30 ක් ලබා දී ඇතත් ගෙවීම් පිළිබඳ විස්තර හෝ ගෙවීම් වවුචර් කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම වෙනුවෙන් මිරිදිය ජලාශවල මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණු රු.මිලියන 30 ක ප්‍රතිපාදන වැය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(iii) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉහත කාර්යය වෙනුවෙන් රු. මිලියන 140 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර රු.මිලියන 123.3 ක් වියදම් දරා තිබුණි. එහෙත් දරා ඇති වියදමට සරිලන පරිදි නිෂ්පාදනවල ඉහළ යෑමක් සිදු වී නොමැති බව එම වර්ෂ 5 නිෂ්පාදන දත්ත අනුව පැහැදිලි වන අතර 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4980 ක වර්ධනයක් පමණක් වාර්තා වී තිබුණි.

(iv) අමාත්‍යාංශය විසින් ලබාදෙන ප්‍රතිපාදනවලට අමතරව ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය හා වෙනත් සංවිධාන මඟින්ද මිරිදිය මත්ස්‍ය පැටවුන් බෝ කිරීම සඳහා සෘජුව වියදම් දැරීම පිළිබඳ සැලකිල්ලට නොගෙන 2014 වර්ෂයේ සිට මෙම කාර්යය සඳහා වාර්ෂිකව අඛණ්ඩව රු. මිලියන 30 බැගින් ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර ගනිමින් මුළු ප්‍රතිපාදිත මුදලම වැය කර තිබුණි.

(ඇ) ධීවර ප්‍රජාව බල ගැන්වීම වැඩසටහන

(i) ධීවර ප්‍රජාව බලගැන්වීමේ වැඩසටහන යටතේ රු. 91,847,432 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර ඉන් රු.74,323,303 ක් වියදම් දරා තිබුණි. එහි භෞතික ප්‍රගතිය පිළිබඳව අමාත්‍යාංශය විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ii) ඉහත වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණු රු.5,427,492 ක ප්‍රතිපාදනවලින් ඉටුකළ කාර්යයන් පිළිබඳ විස්තර කිසිවක් 2017 අගෝස්තු 11 දින වනවිටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) ඉහත වැඩ සටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටයුතු සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන රු. 4,385,700 කින් වියදම් කර තිබුණේ රු. 1,916,043 ක් පමණි. ඒ අනුව රු. 2,469,657 ක හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 54 ක් ඉතිරි වී තිබුණි.

(iv) ධීවරයින් වෙත බෙදාදීම සඳහා රු. 44,945,861 ක මිරිදිය ධීවර යෙදවුම් මිල දී ගැනීම වෙනුවෙන් 2016 වර්ෂයේදී වියදම් දරා තිබුණු අතර එම භාණ්ඩ ධීවරයින් අතර බෙදා දුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(v) තංගල්ල ධීවර කොට්ඨාශයේ පොකිරිස්සන් ඇල්ලීමේ ව්‍යාපෘතිය යටතේ ධීවරයින්ට බෙදාදීම සඳහා දැල් 990 ක් මිලට ගැනීමට රු. 2,270,549 ක ප්‍රතිපාදන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දී ඇතත්, එම දැල් ආම්පන්න ධීවරයින් අතර බෙදාදුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම, එහි ප්‍රගතිය සම්බන්ධයෙන්ද අවධානයක් සිදුකර නොතිබුණි.

(vi) ලුණු අවම කරවල නිෂ්පාදනය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයට රු. 213,575 ක මුදලක් ලබා දී ඇතත් ඊට අදාල පර්යේෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබූ අතර ලුණු අවම කරවල නිෂ්පාදනය සඳහා කිසිදු පියවරක් ගෙන ඇති බවට ද සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් වැය විෂය යටතේ නිල නිවාස අළුත්වැඩියාව සඳහා රු.මිලියන 12.50 ක් වියදම් දරා තිබුණු අතර එම වියදම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මඟ පෙන්වීම් අනුව වියදම් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) මාළු සුප් කැටයක් නිෂ්පාදනයට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයට රු. 392,500 ක් ගෙවා ඇතත් 2017 අගෝස්තු වන විටත් එවැනි නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි.

(උ) ධීවර අමාත්‍යාංශයේ සියලු කටයුතු පරිගණක ජාල ගත කිරීම හා එක් එක් නිලධාරියාගේ කාර්යසාධනය මැනීමට හා පරීක්ෂා කළ හැකි වන පරිදි අන්තර්ජාලගත පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 5.65 කට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව තෝරාගත් ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මෙම උපක්‍රම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයෙදී රු. මිලියන 3.65 ක් සහ 2014 වර්ෂයේදී රු.මිලියන 8 ක් වශයෙන් රු. මිලියන 11.65 ක් වැයකර ඇතත් 2017 වර්ෂය වන විටත් එවැනි පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කළ ප්‍රතිපාදනවලින් මහගල් වැව වසමේ ධීවර විවේකාගාරයේ ගෙබිම සිමෙන්ති දැමීමේ කටයුතු සඳහා රු. 80,556 ක් වැයකර ඇතත් එම කාර්ය නිසි පරිදි ඉටුකර නොමැති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(එ) වැවක් සමඟ ගමක් වැඩ සටහන යටතේ රු. 1,489,888 ක ප්‍රතිපාදන මත බැඳි වැව වසම තුල රු.1,489,888 ක් වැයකර ධීවර ප්‍රජා ශාලාවක් ඉදිකර තිබුණි. ව්‍යාපෘතියේ අරමුණ ධීවර ජනතාව නඟා සිටුවීම වුවද එම ප්‍රදේශය ධීවර පවුල් පදිංචි ප්‍රදේශයක් නොවන බව අනාවරණය විය. එමෙන්ම ගෙබිම සිමෙන්ති දැමීමට රු. 147,960 ක් ගොවි සංවිධානයට ගෙවා ඇතත් ගෙබිම ඉරි තලා පළුදු වී තිබූ අතර ගෙබිම ඉදිකිරීමේ කාර්ය නිසි ප්‍රමිතියකට අනුකූලව සිදු කර නොතිබූ බව අනාවරණය විය.

(ඒ) ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ තංගල්ල හා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටුකළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති තුනක ඉදිකිරීම් කටයුතු නියමිත පරිදි ඉටු කර නොතිබූ බව භෞතික පරීක්ෂණවලදී අනාවරණය විය. එම ඉටු නොකළ කාර්යයන් සඳහා එකතුව රු.මිලියන 2.16 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඔ) ලුණුගම් වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරියෙකු විසින් සකස් කර තිබුණු රු.744,032 ක ඇස්තමේන්තුව මත ලුණුගම් වෙහෙර ජලාශයේ ධීවර යාත්‍රා 100 ක් නතර කළ හැකි පරිදි ජැටියක් ඉදිකිරීම සඳහා ගොවි සංවිධානයකට රු.717,440 ක මුදලකට 2016 ඔක්තෝම්බර් 23 දින පවරා තිබුණි. 2017 නොවැම්බර් 21 දින වන විට එම ගොවි සංවිධානයට රු.706,499 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ඉහත ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු. 706,499 ක් ගෙවා ඇතත් එම ජැටියේ යාත්‍රා නතර කළ නොහැකි බව අදාල ධීවර සමිතියේ සභාපතිවරයා විසින් විගණනයට වාර්තා කර තිබුණි.

(ii) ජැටියේ ඉදිකිරීම් කටයුතු සඳහා යොදන ලද පස් ප්‍රමාණය ගණනය කර නොතිබූ අතර 2017 අගෝස්තු 04 දින කාර්මික නිලධාරි සමග ජැටියට යොදවන ලද පස් ප්‍රමාණයට අදාල මිනුම් ලබා ගැනීමේදි යොදා තිබුණු පස් ප්‍රමාණය මීටර් කියුබ් 716.63 ක් බව අනාවරණය විය. එහෙත් පස් මීටර් කියුබ් 2696.56 ක් වෙනුවෙන් රු. 706,499 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු. 518,742 ක් වැඩිපුර ගෙවා තිබුණු බව අනාවරණය විය.

(iii) ජැටියට තණ පිඩලි ඇල්ලීම වෙනුවෙන් වර්ග මීටර් 1456 ක් සඳහා රු.267,904 ක් ගෙවා ඇතත් සත්‍ය වශයෙන් පැවති ප්‍රමාණය වර්ග මීටර් 1040 ක් පමණක් බව අනාවරණය විය. ඒ අනුව රු. 76,544 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) මෙම ඉදිකිරීම ජලාශය ඇතුලත ඉදිකරන ලද බොරළු පාරකට සමාන වූ අතර ජැටියක් ලෙස භාවිතා කිරීමේ හැකියාවක් නොමැති බවත් ජලාශයේ ජලය සම්පූර්ණයෙන් පිරීම සමඟ පස් යොදා සකස් කරන ලද මෙම ජැටිය සේදී යාමට ලක් විය හැකි බවද අනාවරණය විය. මෙම තත්ත්වය ධීවර සමිතියේ සභාපති විසින් ද තහවුරු කරන ලදී.

(ඕ) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන යටතේ 2016 දෙසැම්බර් මාසයේදී රු. 501,623 ක් වියදම් කර මසුන් අඩුමිලට අලෙවි කිරීමේ කුටියක් ඉදිකර වැඩ අවසන් කර ඇතත් 2017 අගෝස්තු වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ක) ධීවර වරාය නැංගුරම් පොළවල්, තොටුපල සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

(i) කලමැටිය ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2014 ජුලි 9 දින ආරම්භ කර තිබූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 899.53 ක් (වැට් රහිත) විය. 2016 ජුනි 8 දින වැඩ අවසන් කළ යුතුව තිබූ ඉහත ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය සියයට 70 ක් විය. ඒ වන විට වියදම රු.මිලියන 660.25 ක් බව අනාවරණය විය.

(ii) ගාල්ල ධීවර වරාය නව ජැටිය ඉදිකිරීම සඳහා පස් පරීක්ෂණ කටයුතු 2014 නොවැම්බර් 03 දින අවසන් කර තිබූ අතර වැඩ ආරම්භ කර තිබුණේ 2016 නොවැම්බර් 8 දින දීය. ඒ අනුව ප්‍රමාදය වර්ෂ 2 කි. 2017 ජුලි 4 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 2017 ජුනි 30 දින වන විටත් සියයට 15 ක් පමණක් බව අනාවරණය විය.

(iii) කයිකාවල නැංගුරම් තොටුපල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගැනීම නිසා 2014 සැප්තැම්බර් 15 දින වැඩ ආරම්භ කළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2014 ඔක්තෝම්බර් 23 දින සිට නවතා දැමීමට සිදුව තිබුණි. ඒ වන විට කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ සංචලීකරණ අත්තිකාරම් රු.මිලියන 55 ක්, නිම කරන ලද වැඩ කොටස් සඳහා ගෙවූ රු.මිලියන 25.28 ක් සහ උපදේශන ගාස්තු රු.මිලියන 3.12 ක් වශයෙන් එකතුව රු.මිලියන 83.40 ක් වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(iv) රු.මිලියන 28 ක් වූ පලඟතුරේ දියකඩනය දිර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ වැඩ වෙරළ සම්පත් කලමනාකරණ දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර අත්තිකාරම් වශයෙන් රු. 19,984,669 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර තිබූ අතර මුළු වියදම රු.16,982,928 ක් විය. ඉතිරි මුදල වූ රු.3,001,741 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) පොරුතොට දියකඩනය දීර්ඝ කිරීමේ කාර්යය වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් දෙපාර්තමේන්තුවට පවරා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින කාර්යසාධන වාර්තාවෙ හි එහි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

(vi) කුඩාවැල්ල ධීවර වරාය නව ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ පිරිවැය රු.මිලියන 142 ක් වූ අතර 2016 ඔක්තෝම්බර් 13 දින ආරම්භ කර 2017 අප්‍රේල් 29 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණි. එහෙත් 2017 ජූනි 30 දින වන විටත් භෞතික ප්‍රගතිය සියයට 54 ක් බව අනාවරණය විය.

(vii) හම්බන්තොට ධීවර වරායේ දියකඩනය දීර්ඝ කිරීම සඳහා රු.මිලියන 200 ක ප්‍රතිපාදන 2015 වර්ෂයේදී සලසා තිබූ අතර වරාය පරිශ්‍රයේ වැලි ඉවත් කිරීමේ කටයුතු ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 2016 මාර්තු 20 දින අවසන් කර තිබුණි. එහෙත් 2016 ක්‍රියාකාරි සැලැස්මට අනුව දියකඩනය මීටර් 150 කින් දීර්ඝ කිරීමේ කටයුතු සඳහා රු.මිලියන 30 ක් වෙන් කර ඇතත් 2017 ජූනි වන විටත් අදාල කාර්යය ආරම්භ කර නොතිබුණි.

(viii) 2015 වර්ෂයේ ආරම්භ කිරීමට සැලැසුම් කර තිබූ පැරැලිය නැංගුරම් පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය, හලාවත ධීවර වරායේ කලපු මුවදොර ඉදිකිරීම සහ දොඩන්දූව ධීවර වරාය ඉදිකිරීම යන ව්‍යාපෘති 2017 වර්ෂය වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ix) 2016 මැයි 14 දින වැඩ ආරම්භ කළ කරෙයිනගර් බෝට්ටු අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 16 දින වැඩ අවසන් කළයුතුව තිබුණි. එහෙත් 2016 දෙසැම්බර් 31 දිනවන විට මූල්‍ය ප්‍රගතිය සියයට 1.7 ක් වී තිබුණු අතර 2017 තුන්වන කාර්තුව වනවිටත් කිසිදු භෞතික ප්‍රගතියක් නොවීය.

(x) 2016 සැප්තැම්බර් 9 දින වැඩ ආරම්භ කළ වෙන්නප්පුව ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2017 පෙබරවාරි 15 දින අවසන් කළ යුතුව ඇතත් 2017 දෙවන කාර්තුව වන විටත් කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොතිබුණි.

(xi) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් ලබා දුන් ප්‍රමාණ බිල්පත් පදනම් කර ගනිමින් මීගමු කලපු සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 දෙසැම්බර් 14 දින රු.මිලියන 5 ක් ගෙවා ඇතත් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. ව්‍යාපෘතියට අදාල ලියකියවිලි ජනාධිපති විමර්ශන කොමිසම් සභාව වෙත යවා ඇති බැවින් විගණනයට ඉදිරිපත් කළනොහැකි බව වාර්තා කරන ලදී.

**3.12 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ගිණුම් 07 කට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පශ්වාත් සුනාමි පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ ඉහත බැංකු ගිණුම්වල 2014 දෙසැම්බර් 31 දිනට ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ වලංගු කාලය ඉක්මවා ඇති වටිනාකම රු.16,735 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර, චෙක්පත්වල විස්තර ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

**3.13 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම,ගොඩනැගිලි හා ඉදිකිරීම් අලුත්වැඩියාව සඳහා 2016 වර්ෂයේ දී වියදම් දරන ලද රු.මිලියන 12.50 ක වියදමට අදාලව ලංසු කැඳවීමේ ලේඛන, ප්‍රසම්පාදන මණ්ඩල තීරණ, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා හා තෝරාගත් සැපයීම්කරු පිළිබඳ තොරතුරු සහ අදාල වියදම් දැරීම පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය උපදේශාත්මක සේවා ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික සමාගමකට රු.මිලියන 2.64 ක් ගෙවීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 සැප්තැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනාවක් අනුව බව දක්වමින් ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා උපදේශාත්මක සමාගමක සහය ලබා ගැනීමට තීරණය කර ඇතත්, ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් එවැනි අනුමැතියක් ලබා දී නොතිබුණි.

(ii) උපදේශාත්මක ආයතනයක් තෝරා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ආයතන 6 කින් මිල ගණන් කැඳවූ බව දක්වා ඇතත් අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර ලැබුණු මිල ගණන් පිළිබඳ තොරතුරු ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මිල කැඳවීමට අනුව ආයතන 2 කින් මිල ගණන් ඉදිරිපත් කළ බව දක්වා ඇතත් එම විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) 2015 පෙබරවාරි 10 දින රැස් වූ ප්‍රසම්පාදන කමිටුව, අවම මිල ලෙස ඉදිරිපත් වූ රු.මිලියන 2.80 ක මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු පැහැදිලි කිරීමකින් තොරව රු.මිලියන 3.90 ක මිල ඉදිරිපත් කර තිබූ ආයතනය සමඟ සාකච්ඡා කර රු.මිලියන 3.12 ක වටිනාකමකට අදාල කාර්ය පවරා තිබුණි.

(iv) ඉහත වටිනාකමට උපදේශාත්මක සේවාව ලබා දීමට එකඟ වූ සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි.

(v) උපදේශාත්මක සමාගම විසින් අදාල කාර්ය නිසි පරිදි ඉටු කර නොමැති බව 2016 නොවැම්බර් 18 දින පැවති ලංකා ධීවර සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. උපදේශාත්මක වාර්තාව සමාලෝචනය කළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් ද අදාල වාර්තාව පිළිගත හැකි මට්ටමේ වාර්තාවක් නොවන බව තීරණය කර තිබුණි.

(vi) ඉහත තීරණ මත සැපයුම්කරුට ගෙවිය යුතු ගාස්තුවෙන් රු.මිලියන 1.03 ක් අඩුකර ගෙවීමට නිර්දේශ කර ඇතත් රු. 320,385 ක් වැඩිපුර සැපයුම්කරුට ගෙවා තිබුණි.

(vii) 2016 පෙබරවාරි 02 දිනැති අංක MF/PE/CM/2016/08 දරන මුදල් අමාත්‍යවරයාගේ ලිපියේ 04 ඡේදයේ සඳහන් පරිදි මහා භාණ්ඩාගාරය විසින් ලංකා ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ලබා දී තිබුණු රු.මිලියන 689 ක මුදල විධිමත් පරිදි උපයෝජනය කර එහි ප්‍රගතිය මාසිකව මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලෙස උපදෙස් දී ඇතත් එපරිදි කටයුතු කර නොතිබුණි.

(viii) 2016 වර්ෂයේ දී පරිපූරක ප්‍රතිපාදන ලෙස මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 890.19 ක සහ මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ රු.මිලියන 3.10 ක් වශයෙන් රු.මිලියන 893.29 ක් ධීවර සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇතත් එහි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

**3.14 පාඩු හා හානි**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 20 දින වාහනයක් අනතුරකට භාජනය වී ඇතත් පසුගිය වර්ෂයේ විසර්ජන ගිණුමේ පාඩු හා හානි ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ පිළිතුරට අනුව මුදල් රෙගුලාසි 104 යටතේ පරීක්ෂණ පවත්වන බව දක්වා තිබුණත් 2016 විසර්ජන ගිණුමේ පාඩු හා හානි යටතේ එම අනතුර පිළිබඳ වාර්තා කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 26 දින වාහනයට සිදු වූ අනතුරින් අලාභය රු.939,173 ක් විය. මේ සම්බන්ධයෙන් 2016 අගෝස්තු 09 දිනැති අමාත්‍යාංශ ලේකම්ගේ පිළිතුරු අනුව ප්‍රවාහන අංශය සතුව අනතුරට අදාල වාර්තා හා ලිපිගොනු නොමැති බව දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.7, ඩී.ජී.එස්.ඒ.7 (i) ආකෘතිවල මෙම අනතුර පිළිබඳව වාර්තා කර නොතිබුණි.

(ඇ) 2013 අගෝස්තු 11 දින වාහනයක් අනතුරට පත්වීමෙන් සිදු වූ රු.512,080 ක අලාභය 2017 මැයි 09 දිනය වනවිටත් අයකරගෙන නොතිබූ අතර එය විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ (ඩී.ජී.එස්.ඒ 7) හා පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ (ඩී.ජී.එස්.ඒ 7(i)) දක්වා නොතිබුණි.

(ඇ) 2016 ජනවාරි සිට ජූලි 31 දක්වා අමාත්‍යාංශයේ වාහන 10 කට සිදු වූ රු.මිලියන 6.64 ක හානි පිළිබඳ විස්තර විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ (ඩී.ජී.එස්.ඒ7) දක්වා නොතිබූ අතර 2016 අගෝස්තු සිට දෙසැම්බර් 31 දින දක්වා සිදු වූ වාහන අනතුරු 04 ක ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීය.

**3.15 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 17 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 116 | 77 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 54 | 47 | 07 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 02 | 02 |
| | එකතුව | 200 | 147 | 53 |

(ආ) 2010 මැයි 14 දිනැති අංක සී.ඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත සහය කාර්ය මණ්ඩලයේ උපරිමය 15 ක් වුවත් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය කාර්ය මණ්ඩලය ලෙස 2016 වර්ෂයේදී 21 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලය 06 දෙනෙකු වැඩිපුර අනුයුක්ත කර තිබුණි.

(ඇ) අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නොවන තාවකාලික තනතුරක් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 හි එස්.එල් - 2006 වැටුප් පරිමාණය ගෙවීම සඳහා සහකාර ලේකම්වරයෙක් (කම්කරු සබඳතා) පත් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ධීවර හා ජලජ සම්පත් සවර්ධන අමාත්‍යාංශයේ කම්කරු සබඳතා අංශයක් ස්ථාපනය කර නොතිබුණි.

(ii) ඉහත නිලධාරියාට 2016 මැයි 30 දින සිට නොවැම්බර් දක්වා රු. 411,892 ක් වැටුප් ලෙස ගෙවා ඇතත් රාජකාරි පැවරීමක් සිදු කර නොතිබුණි.

(iii) අදාල තනතුර නිලවාහනයක් හිමි නොවන තනතුරක් වුවද අමාත්‍යාංශය සතු වාහනයක් නිලධාරියාගේ ප්‍රවාහන කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.

(iv) 2016 අප්‍රේල් 13 දින සිට 2016 නොවැම්බර් 30 දින දක්වා ඉහත වාහනය කිලෝමීටර් 14636 ක් ධාවනය කර තිබූ අතර 2016 අප්‍රේල් 13 දින සිට ජූලි 30 දක්වා කාලය සඳහා ඉන්ධන වියදම් ලෙස රු. 118,291 ක් ගෙවා තිබුණි.